ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක ශ්‍රී ලංකා ආරක්ෂක ලේකම්, යුධ හමුදාපති හා නාවික හමුදාපති හමුවේ</u>**

ශ්‍රී ලංකාවට පැමිණෙන විදෙස් රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා ශ්‍රී ලංකා රජය විසින් නිර්දේශ කර තිබෙන සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කිරීමෙන් අනතුරුව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ නව ආරක්ෂක උපදේශක කපිතාන් (ඉන්දියානු නාවික හමුදාව) විකාස් සූද් ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ හමුදා ප්‍රධානීන් හමු විය.

2. කපිතාන් සූද් 2020 ජූලි 28 වන දින ශ්‍රී ලංකා ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමාද, ජූලි 27 වන දින වැඩ බලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා යුධ හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමාද ජූලි 29 වන දින ශ්‍රී ලංකා නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මැතිතුමාද හමු විය.

3. දෙරටෙහි හමුදාවන් අතර පවතින සාම්ප්‍රදායික සුහදත්වය සහ මිත්‍රත්වය එලෙසම පවත්වා ගනිමින් මෙහිදී ද්විපාර්ශවික ආරක්ෂක සහයෝගීතාවය තුළ අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් කරුණු රාශියක් සාකච්ඡා කෙරිණ. එසේම මෙහිදී, දෙරටෙහිම නියෝජිතයන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ආරක්ෂක සම්බන්ධතාවය වඩා ශක්තිමත් කර ගැනීම උදෙසා දැඩිව කැපවන බව අවධාරණය කරන ලදී.

4. පුහුණු වීම් සහ වෙනත් සමීප සබඳතා වැනි දේ තුළින් කුසලතා සංවර්ධන ක්ෂේත්‍රය මත පදනම්ව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ශක්තිමත් සහ වර්ධනය වන ආරක්ෂක සම්බන්ධතාවයක් පවත්වාගෙන යන බව මෙහිදී ප්‍රකාශ කෙරිණ. ඉන්දියාව විසින් විදේශීය හමුදාවන් සඳහා ලබා දෙන පුහුණු අවස්ථාවන්ගෙන් අඩකට වඩා ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සාමාජිකයන්ට ලබා දේ. දෙරටටම පොදු ආරක්ෂක කරුණු සහ අභියෝග මෙන්ම කලාපය තුළ ආරක්ෂාව සහ සාමය තහවුරු වන ලෙස ඒවාට මුහුණ දීමට අන්‍යෝන්‍ය වශයෙන් දක්වන අධිෂ්ඨානය ද්විපාර්ශවික ආරක්ෂක සබඳතා සඳහා මඟ පෙන්වන බව මෙහිදී සඳහන් කරන ලදී. ඉහළ පෙළේ නිරන්තර හමුවීම් සහ අන්තර් ක්‍රියා, ඒකාබද්ධ පුහුණුවීම් සහ අභ්‍යාස, නෞකා සංචාර සහ ක්‍රීඩා වැඩසටහන් යනාදිය මෙම ශක්තිමත් සහයෝගීතාවයේ ප්‍රධානතම අංග වේ.

5. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැනවී තිබෙන සංචරණ සීමා හමුවේ වුවද මෙම වසරේදී දෙරටෙහි ආරක්ෂක ක්ෂේත්‍රය තුළ සිදුවූ හමුවීම් සහ අන්තර් ක්‍රියා පිළිබඳව සතුට මෙහිදී පළ කෙරිණ. නියෝජිත

මට්ටමේ සංචාර කිහිපයක් මෙම වසරේදී සිදු වූ අතර එයට අමතරව  මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා සහ ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා 2020 පෙබරවාරි මස ඉන්දියාවේ ලක්නව් හි පැවති ආරක්ෂක ප්‍රදර්ශනය 2020 සඳහා සහභාගී විය.

6. 2020 ජූනි මස ඉන්දීය නාවික හමුදාවේ ජලශ්වා නෞකාව මගින් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සිරව සිටි ඉන්දීය ජාතිකයන් නැවතත් මව්රටට රැගෙන යාම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලබා දුන් විශිෂ්ට සහයෝගය සම්බන්ධයෙන් ඉන්දියාවේ කෘතවේදීත්වය මෙහිදී පළ කෙරිණ. මෙම මෙහෙයුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම ඉන්දීය සහ ශ්‍රී ලංකා හමුදාවන් අතර තිබෙන ඉතා සමීප සබඳතා සඳහා සාක්ෂියක් වේ.

7. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මතුව තිබෙන අභියෝගයන්ට මුහුණ දීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට දෙරටෙහි නායකත්වය දක්වන කැපවීම අනුව ඉන්දියාව පසුගිය මාස වලදී ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය වෛද්‍ය සහය ලබා දී ඇති බව මෙහිදී සඳහන් කෙරිණ. මෙම සන්දර්භය තුළ ඉන්දීය නාවික හමුදාව කොවිඩ්-19 රෝගීන් ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන උපාංග දෙකක්ද උෂ්ණත්ව ස්කෑනර හතරක්ද ශ්‍රී ලංකා නාවික හමුදාවට පරිත්‍යාග කර ඇති බව මෙහිදී සිහිපත් කෙරිණ. කොවිඩ් වසංගතයට සාර්ථකව මුහුණ දීම  සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතු වටිනා අත්දැකීම් සහ ශ්‍රී ලංකාව විසින් අනුගමනය කරන ලද මනා පිළිවෙත් බෙදා හදා ගැනීම උදෙසා ඉන්දියාව විසින් බංග්ලාදේශය, තායිලන්තය සහ මියන්මාරය ඇතුළු විවිධ සහකාර රාජ්‍යයන් සඳහා සංවිධානය කරන ලද අන්තර්ජාල සම්මන්ත්‍රණයක් සඳහා ශ්‍රී ලංකා යුධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එච්. ජේ. එස්. ගුණවර්ධන මහතා සහභාගී වීම මෙහිදී අගය කරන ලදී.

8. ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා සාමාජිකයන් 400කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් මෙම වසරේ ජූනි 21 වන දින ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානයේ පැවති ජාත්‍යන්තර යෝගා දින සැමරුම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර මෙන්ම දෙරටෙහි හමුදාවන් අතර පවතින සමීප වෘත්තීමය සහ සංස්කෘතික සබඳතාවය තවදුරටත් සනාථ කරන්නක් බව මෙහිදී ප්‍රකාශ කෙරිණ.

***

කොළඹ

ශක වර්ෂ 1942 ශ්‍රාවන 11

2020 අගෝස්තු 2